

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 58 වන කාණ්ඩය | බු.ව. 2559 මැදින් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2016 මාර්තු මස 22 වන ද | 11 වන කලබ |
|---|---|---|

# දියුණුවේ ඉණි මඟ

පළමුව තමන් දියුණුව මඟ බලන්නට
දෙවනුව අනුන් හට හිරිහැර නො දෙන්නට
තෙවනුව රටුන්ටත් හිත වැඩ කරන්නට
සිතමුව නිකම් බොරුවට නො දඟලන්නට

අනුන් ගෙන් ම ඉණ බඩ වඩනා ගතිය
හිඟන් - නන්ගේ සිරිතක් බව දත යුතුය
එයින් මිදුණු හරි පිරිමින් ගේ ගතිය
ලබන් ට නම් නොමැළි ව වැඩ කළ යුතුය

"කෑම යුතු නො වෙයි වැඩ නො කරන අයට"
කීම නම් සැබෑවෙකි පැවැති පෙර සිට
මේම සිතා විළි වැද දුරැර නිදි ගැට
බෝම තැත් කරවු සියතින් රැකෙන්නට

**- අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහානායක මාහිමිපාණෝ**



# ඇයි අනුන් හට දුක් දෙන්නේ

**අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමිපාණන් වහන්සේ විසිනි.**

පින්වත් ළමයිනි,

බණ නො දන්නෝ පින් පව් නො දනිති. දියුණුව නොදියුණුව නො දනිති. මවුපිය යුතුකම් නො දනිති. අඹුසැමි යුතුකම් නො දනිති. ගුරු ශිෂ්‍ය යුතුකම් නො දනිති. ස්වාමිවරුන්ගේ යුතුකම් නො දනිති. මෙහෙකරුවන්ගේ යුතුකම් නො දනිති. දරුවන්ගේ යුතුකම් නො දනිති. දායකයන්ගේ යුතුකම් නො දනිති. භික්ෂූන්ගේ යුතුකම් නො දනිති. එබැවින් ඔවුහු ඇස් නැත්තන් මෙන් අන්ධ ව ක්‍රියා කෙරෙති.

බෞද්ධ ළමයි බොහෝ පින් ඇති දරුවෝ ය. ඔවුහු පස් පව් දස අකුසල් නො කරති. පව් කිරීමට බිය වෙති. අපේ මහා කාරුණික බුදුරජාණන් වහන්සේගේ ධර්මය දන්නා බැවින් ඔවුහු තමන්හට අයත් යුතුකම් ඉතා හොඳින් සිදු කෙරෙති. බුදුබණ උගත් දරුවෝ මෙහෙකරුවනට ඉතා ම ආදරයෙන් සංග්‍රහ කෙරෙති. කුස පිරෙන්නට ඔවුනට කෑම දෙති. කාට දෙතත් කුස පිරෙන්නට ම කන්නට දෙති. හොඳ කෑම වර්ග තනියෙ ම නො කති. තමන්ගේ අසරණ මෙහෙකරුවනටත් ඒ හොඳ කෑම දෙති.

බුදුබණ දත් දරුවෝ ම මහා පින්වන්තයෝ වෙති. හොඳ බෞද්ධ ළමයි බණ පොත් කියවන්නට ඉතා කැමතියහ. බණ අහන්නට ඉතා කැමතියහ. දීමට බොහෝ කැමති වෙති. භික්ෂූන් වහන්සේලාට අපමණ ආදරයෙන් සලකති. නිතර සිල්වත් ගුණවත් ස්වාමීන් වහන්සේලා ගේ

ආශ්‍රයට යති. එවැනි යහපත් ළමයින් ළඟ තිබෙන උතුම් ගුණරුවන් අන් ළමයින් ළඟ දක්නට නැත. හොඳ බෞද්ධයෝ අසරණ ලෝකයා කෙරෙහි තිබෙන අනුකම්පාව නිසා සිගරට් සුරුට්ටු වත් නො බොති. අපේ රටේ සුරාසල් වස්වා මත්පැන් බීම පවා නැති කර දමන්නට උත්සාහ දරති. එසේ කිරීම රටට ආශීර්වාදයකි.

ඉතින් පින්වත් ළමයිනි! සියලු යහපතට මුල නම් අපේ උතුම් සිල්වත් ගුණවත් ස්වාමීන්වහන්සේලා ආශ්‍රය කිරීම යි. උන් වහන්සේලා පින්වත් දරුවනට පමණක් නො ව මුළු ලොව හැම මනුෂ්‍යයනට ම හැම සත්ත්වයනට ම බොහෝ අනුකම්පා කරති. සව් සත්නට නිතර ම මෙත් වඩති. බෞද්ධ දරුවන්ගේ මාර්ගෝපදේශකයාණෝ (=හොඳ මඟ පෙන් වන්නෝ) නම් අපේ උතුම් සංඝයා වහන්සේ ය.

නමින් පමණක් බෞද්ධ වූ දුසිල් මිනිසුන් නිසා සියලු බෞද්ධයනට දොස් නැඟීම හොඳ නැත. ඇතැම් නරක දුසිල් මහණුන් නිසා අපේ උතුම් සිල්වත් ගුණවත් ස්වාමීන්වහන්සේලාට දෙස් නැඟීම ද හොඳ නැත. හොඳ භික්ෂූන් වහන්සේ නමක් දැකීමෙන් ම බෞද්ධ පින්වතුන් තුළ ශ්‍රද්ධා ආදි ගුණාංග පහළ වේ. ඇත්තෙන් ම දරුවෙනි! හොඳ බුද්ධපුත්‍රයන් වහන්සේ නමක් ආශ්‍රය කරන්නට ලැබීම ලොකු ම භාග්‍යයෙකි. (=වාසනාවකි). හොඳ ස්වාමීන්වහන්සේලා බොහො ම කරුණාවන්තයෝ ය. උන් වහන්සේලා බෞද්ධ දරුවන්ගේ දුක ගැන දනිති. ඒ නිසාත් එහෙමට කාගෙන් වත් කිසිවක් නො ඉල්ලති. ලද පමණින් සතුටට පත් වෙති.

එහෙත් බෞද්ධ දරුවෝ භික්ෂූන් වහන්සේලාට ඉතා ම ශ්‍රද්ධාවෙන් ආදරයෙන් උපස්ථාන කෙරෙති. උන් වහන්සේලාගේ ඕනෑ එපාකම් ගැන නිතර සොයා බලති. උන් වහන්සේලාගේ සුව දුක තමන්ගේ සුව දුක මෙන් සලකති. තමන්ගේ පණ මෙන් සංඝයා වහන්සේලාට ඉතා ම හිතවත් වෙති, ආදරය දක්වති. මහණදම් පිරීම අමාරු ය. එසේ අමාරුවෙන් මහණදම් පුරන බුද්ධපුත්‍රයන් වහන්සේට උසස් ගුණදම් පිරීමට අනුබල දෙති. හැම අතින් ම රැකුල් දෙති.

එහෙත් ඇතැම් බෞද්ධ දරුවෝ භික්ෂූන් වහන්සේගේ වටිනාකම ගැන නො දනිති. එබැවින් උන් වහන්සේලාට ගෞරව නො කරති. ඇතැම් උඩඟු බෞද්ධ දරුවෝ වඳින්නට පවා මැලි වෙති. එසේ වන්නේ අපේ උතුම් බුද්ධාගම නොදැනීම නිසා ය. ඇතැම් පින් අඩු අය භික්ෂූන් වහන්සේලාට නින්දා අපහාස කෙරෙති. බණිති. ගසති.

ඉතින් හොඳ ළමයිනි! පෙර වැදි මිනිසෙක් සිටියේ ය. දිනක් හේ බල්ලන් පිරිවරා ගෙන දුනු රැගෙන දඩයම් පිණිස කැළයට ගියේ ය. එසේ යන විට අතර මඟදී පිඬු සිඟා වඩින ස්වාමීන් වහන්සේ නමක් හමු විය. දැක කිපී "ම-විසින් කාලකණ්ණියෙක් දක්නා ලද්දේ ය. අද නම් මට කිසිවක් නො ලැබේ" ය යි සිතමින් හේ වනයට ගියේ ය. ස්වාමීන් වහන්සේ ද ගමේ දන් වළඳා පෙරළා පන්සලට වඩින සේක. වැද්දා ද කැළෑවෙහි ඇවිද කිසිවක් නො ලැබ ආපසු ගෙදර යන්නේ නැවැතත් ස්වාමීන් වහන්සේ දුටුවේ ය. දැක කිපී "අද උදසණ මේ කාලකණ්ණියා දැක කැළෑවට ගියේ කිසිවක් නො ලදිමි. දැනුත් මේ තෙමේ මා ඉදිරියට ආයේ ය. බල්ලන් ලවා කවමි" කියා බල්ලන් උනා දැමී ය. ස්වාමීන් වහන්සේ 'එසේ නො කරව උපාසකයෙනි' යි කීහ. හේ එය නො පිළිගෙන බල්ලන් මෙහෙයා ලී ය. ඉතින් උන් වහන්සේ වහා එක් ගසකට නැඟ බඹයක් පමණ උස් තැනෙක්හි වැඩ හුන් සේක. විපතක දී ගස් නැඟීම වරදක් නො වේ. බල්ලෝ ගස වට කර ගත්හ. වැද්දා "ගසට නැඟත් තමුන්නාන්සේට ගැළවීමක් නැතැ"යි බිම හෙළනු පිණිස ඊතලය අගින් යට පතුලට ඇන්නේ ය. "එසේ නො කරව" යි කී නමුත් වැද්දා විදින්නේ ම ය. උන් වහන්සේ එක පතුලකට විදින කල එය ඔසවති, අනෙක පාත් කරති. මෙසේ උන් වහන්සේගේ වචනය නො පිළිගෙන පතුල් දෙකට ම විදින්නේ ම ය. එ කල එ හිමියන්ගේ මුළු ශරීරය ම ගිනි ගත්තාක් මෙන් විය. බලවත් වේදනා ඇතිව සිහි එළවා ගත නො හී හුන් සඳ එ හිමියන්ගේ පොරවා ගෙන තුබුණු සිවුර ගැලවී වැද්දාගේ හිස මත්තෙහි වැටී මුළු ශරීරය වැසී ගියේ ය. බල්ලෝ "ස්වාමීන් වහන්සේ වැටී ගියහ" යි සිතා සිවුර තුළට වැද ස්වකීය ස්වාමියා වූ වැද්දාගේ ඇඟ මස් කා ඇට සැකිල්ල පමණක් ඉතිරි කළහ. ඇඟ මස් බඩ පුරා කා නිමවා සිවුරෙන් පිටත්

ව සිටියේ ය. එවිට උන් වහන්සේ වියළි ලී කෝටුවක් කඩා දැමූහ. බල්ලෝ ස්වාමීන් වහන්සේ දැක "අපගේ ස්වාමියා ම අප විසින් කා දමන ලදැ" යි දැන කැළෑවට ගියහ.

ඉතින් පින්වත් දරුවෙනි! කා හට වුවත් අපරාධයක් කිරීම මහා භයානක ය. ඉනුත් අහිංසකයන්ට හිංසා කිරීම, නිරපරාධයන් හට අපරාධ කිරීම ඉතා ම නරක ය, භයානක ය. බුදු බණ නොදත් දරුවෝ ම මෙරමාට (=අන්‍යයනට) නන් වැදෑරුම් දුක් දෙති. අනේ දරුවෙනි! ඇතැම් අය ඉණ බඩ රැක ගැනීමට අල්ලස් ගනිති. ඇතැමෙක් හිමියන් අහිමියන් කෙරෙති. ඇතැමෙක් අහිමියන් හිමියන් කෙරෙති. සිනාසෙමින් මෙරමාට දඩ ගසති. දඬුවම් දෙති. අනුන් හිරගෙයට නියම කෙරෙති. අනුන් තළති. පෙළති. බුදුබණ **නො දන්නෝ ම අනුන් එල්ලුම් ගහට නියම කෙරෙති. මෙරමාට සිනාසෙමින් දඬුවම් දෙති. අනුන් හට ගිනි දෙති. එසේ දඬුවම් කරන්නෝ ද, කරවන්නෝ ද පසුව දඬුවම් ලබන්නෝ ද වෙති. මිනී මරන්නෝ ද පසුව තුමූ ම මැරුම් ලබන්නෝ ද වෙති. අනුන් අනාථ කරන්නෝ පසුව තුමූ ම අනාථ වන්නෝ වෙති.**

ලෝකයාගේ දුක දන්නෝ බුදුබණ උගත් සිල්වත් ගුණවත් අපේ බෞද්ධ දරුවෝ ම ය. අනුන්ගේ හිත් සනසන්නෝ අපේ බුදුබණ උගත් බෞද්ධ දරුවෝ ම ය.

අපි මෙරමාට කුමට දඬුවම් දෙමු ද? එය වැරදි ය. ස්වකීය කර්මය ම තමාට දඬුවම් දෙයි. අපි කුමට අත පුළුස්සා ගනිමු ද? අපරදිග වැසියෝ ගසන්නන් හට ගසති. බණින්නන් හට බණිති. සොරකම් කළ අයට දඬුවම් කරති. මිනීමරුවන් මරති. එය වැරදි ය. එය අපරදිග අනාර්ය දර්ශනය යි.

පින්වත් දරුවෙනි! අපේ මහාකාරුණික බුදුපියාණන් වහන්සේගේ ශාන්ත සීතල ධර්මය ඉගෙන ගන්න! එය ලොව සනසන්නකි. මුළු ලොව ම සුඛිත මුදිත කරන්නකි. ඒ උතුම් බෞද්ධ දර්ශනය මහා නුවණ ඇති අයට ම ගෝචර වේ. පින්වත් දරුවෝ ද මුළු ලොව හැම මනුෂ්‍යයෝ ද බුදු දහමින් හොඳ කල්පනාව ලබත් වා!

සියලු සත්ත්වයෝ නිදුක් වෙත් වා! නීරෝග වෙත් වා! සුවපත් වෙත් වා!



# මිණිකැටයක් වනු පුතුනේ

ළා හිරු රැස් දහරින්
සුපිපේ මල් කැකුළු
මඳ සුළඟේ සැලෙනා
කැකුළකි ඔබ පුතුනේ

ලොවට සුවඳ බෙදලා
මල් පරවී යනවා
රටට දැයට වැඩැති
මිණි කැට වනු පුතුනේ

පාසල නැණ බෙදනා
පන්සල ගුණ වඩනා
ඔබෙ යහපත සඳහා
දෙගුරුන් වඳිනු මැනේ

ගී පද රචනය
**රත්නපාල වික්‍රමසිංහ මාමා**



# අනඳ මහ තෙර සිරිතෙන් බොදු ළමා පෙළට පාඩම්

සිරි වජිරාරාමවාසී, ගෞරව ශාස්ත්‍රවේදී
පූජ්‍යපාද කුරුණෑගල චරණධම්ම හිමියන් විසිනි.

ඉගෙනගන්නා දෙය මතකයේ නොරැඳීම නූතනයේ අධ්‍යාපනය ලබන සිසුන් නිතර මැසිවිලි නඟන කරුණකි. මෙය කුඩා සිසු සිසුවියන්ගේ පටන් විශ්ව විද්‍යාල මට්ටමේ සිසු සිසුවියන් දක්වා ම ඇති බරපතළ ගැටලුවක් බවට පත් වී තිබේ. බොහෝ අය පවසන්නේ කෙතරම් පාඩම් කළත් මතකයේ නොරැඳෙන බවයි. ඉගෙන ගන්නා විෂය ක්ෂේත්‍රයේ භේදයක් නොමැතිව මෙම ගැටලුව පවතින බව පෙනේ. මීට විසඳුමක් සෙවුමට ගුරුවරු මෙන් ම සිසුන් ද යම් කැප කිරීමක් කළ යුතු වේ. මන්ද, අධ්‍යාපන ක්‍රියාවලිය ගුරු ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම සහභාගිත්වයෙන් සිදු වන ද්විපාර්ශ්වික ක්‍රියාවලියක් බැවිනි. මෙහිදී අවධානය යොමු කරන්නේ ශිෂ්‍ය පාර්ශ්වයේ මතක තබා ගැනීම නැත්නම් උගත් දෑ ධාරණය කර ගැනීම සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග කවරේ ද යන්න පිළිබඳ බුදුසමයෙන් ලබාගත හැකි විසඳුම සොයා බැලීමට ය.

සාසන ඉතිහාසයේ ඉතා විශිෂ්ට ලෙස ධර්මය ධාරණය කරගත් මතක තබා ගත් විශිෂ්ට ශ්‍රාවක චරිතයක් අපට හමු වේ. ඒ සම්බුදුරජාණන් වහන්සේගේ අග්‍රෝපස්ථායක, ධර්ම භාණ්ඩාගාරික අනඳ මහා රහතන් වහන්සේ යි. උන්වහන්සේගේ මතක ශක්තියේ ආශ්චර්යවත් හා විශිෂ්ට බව පිළිබඳ උදාහරණ සාසන ඉතිහාසයේ ඕනෑ තරම් තිබේ. ඒ අතර හොඳ ම උදාහරණය ප්‍රථම ධර්ම සංගායනාවේ දී ධර්ම-විනය සංගායනා කිරීමේ දී ධර්මය පිළිබඳ ප්‍රශ්න විචාරා පිළිතුරු ලබා ගැනීමට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූයේ අනඳ මහ රහතන් වහන්සේ වීමයි.

උන්වහන්සේ මේ ආකාරයට ධර්මය ධාරණය කරගත් ක්‍රමය අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ ධම්මික වර්ගයේ ආනන්ද සූත්‍රයේදී සැරියුත් මහරහතන් වහන්සේ විසින් ආනන්ද මහ රහතන් වහන්සේ සතු මෙම ආශ්චර්යවත් ධාරණ ශක්තිය සඳහා හේතුවන කරුණු 6 ක් දේශනා කොට තිබේ.

එම කරුණු සය කවර අධ්‍යයන කාර්යයක දී වුවද භාවිත කළ හැකි, ශාස්ත්‍රය හොඳින් ග්‍රහණය කර ගත හැකි මඟක් බව පැහැදිලි වේ.

එම කරුණු 6 ආනන්ද සූත්‍රය අනුව මෙසේ යඃ

1. හොඳින් ධර්මය අසා දැන ගැනීම
2. අසාගත් ධර්මය විස්තර ලෙස අන් අයට ඉගැන්වීම
3. ඒ අනුව අන් අයට කියැවීම
4. ඒ අනුව විස්තර වශයෙන් සජ්ඣායනා කිරීම

5. ඇසූ ධර්මය තමා විසින් තර්ක විතර්ක කරමින් මනසින් විමසීම
6. තවදුරටත් සැක තිබේ නම්, ධර්මධරයකු වෙත ඒ ඒ ධර්ම කොටස්වල අපැහැදිලි තැන් ඉදිරිපත් කර සාකච්ඡා කිරීමෙන් සැක දුරු කොට, ඇසූ ධර්මය තහවුරු කර ගැනීම

මෙම කරුණු 6 ධර්මය ඉගෙනීමට සහ ධාරණය කර ගැනීම සඳහා පමණක් නොව කවර විෂය ශාස්ත්‍රයක් ඉගෙනීමට වුවද භාවිත කළ හැකි ඉතා ම විද්‍යානුකූල ක්‍රමවේදයකි. ඒ අනුව නූතන අධ්‍යයන කටයුතුවල නිරත වන අප කා හටත් හොඳින් ඉගෙන ගන්නා දෙය ධාරණය කර ගැනීම සඳහා මෙම ක්‍රමයට අධ්‍යන කටයුතු කිරීමට හුරු පුරුදු වීම විපුල ඵල ගෙන දෙන කරුණක් වනු නොඅනුමාන ය.

පළමුව යමක් උගන්වන විට උවමනාවෙන් යොමුකළ කන් ඇතිව එය අසා සිටිය යුතු වේ. යොමු කළ කන් ඇතිව යන්නෙන් අදහස් වන්නේ මනස පූර්ණ වශයෙන් ශ්‍රවණය කරන කරුණු කෙරෙහි ම පවත්වා ගනිමින් ඉන්ද්‍රියයන් සියල්ල ම ඒ අරමුණ වෙත ම යොමු කොට ශ්‍රවණය කිරීමයි.

මීළඟට ඇසූ දේ අන් අයට ඉගැන්වීම කියැවීම, කියාදීම කළයුතු වේ. ඒ තුළින් තම දැනුම වැඩිවනවා පමණක් නොව නොදන්නා තවත් අයට මහත් ප්‍රයෝජන වේ. තමාට නැවතත් ඇසූ දෙය ශ්‍රවණය වීම තුළින් මතකය අලුත් වේ. අද පවතින තරගකාරී අතිධාවනකාරී අධ්‍යාපනය හමුවේ තව කෙනෙකුට තමන් දන්නා යමක් පැවසීමට බොහෝ දෙනා මැලි වෙති. තමා පමණක් දැනගෙන සිටීමට උත්සාහවත් වෙති. එහෙත් එසේ පවසා නොසිටීම අවසානයේ එය

තමාගේ මතකයෙන් ගිලිහී යෑමට හේතු වේ. එමනිසා අන් අයට ඇසූ දේ කියා දීම, ඉගැන්වීම තමාට මෙන්ම අන් අයට ධාරණ ශක්තිය ඇති වීමට මහත් පිටිවහලක් වනු නියත ය.

ඉගෙන ගත් දෙය නිතර නිතර කියවිය යුතු ය. සජ්ඣායනා යනු හඬනගා කියැවීමයි. එසේ කියැවීම තුළින් මතකය ගිලිහී යෑම වළක්වාලනු ලැබේ. තමා උගත් දෙය පිළිබඳ මතකයෙන් තර්ක කරමින් මෙනෙහි කළ යුතු ය. එවිට මතකය තවදුරටත් තීව්‍ර වේ. උගත් දෙය පිළිබඳව ඇති සැක සංකා තිබේ නම් ගුරුවරයාගෙන් හෝ අසා සැක හැර ගැනීමට අනතිතමානී විය යුතු ය. මෙම ක්‍රියාවලිය අනුගමනය කරන ඕනෑම කෙනෙකුට තමා අසා දැන ගත් බොහෝ කරුණු දිගු කලක් මතකය තුළ රඳවා තබා ගෙන නැවත පහසුවෙන් ආවර්ජනය කිරීමට හැකියාව සැලසේ.

ආනන්ද මහ රහතන් වහන්සේ භාවිත කළ පිළිවෙත් නූතන අධ්‍යාපන කටයුතුවල නිරත අප ද අනුගමනය කිරීම බෙහෙවින් සාර්ථක ප්‍රතිඵල වෙත ළඟා වීමට තනා දෙන ඉණි මං වැනි ය. එබැවින් අනඳ මා හිමි අනුව යමින් අපගේ ඉගෙනීම් කටයුතු සාර්ථක කර ගන්නට මේ පුන් පෝදා තරයේ අදිටන් කර ගනිමු.

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

## නිවැරදි කිරීමයි

පසු ගිය නවම් කලබෙහි "ධර්මවීරයන් විය හැක්කේ කෙසේ ද? ධර්මවීරයන් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද?" යන ලිපියේ කතුවරයා අනගාරික ධර්මසේකරතුමා ය. එය අනගාරික ධර්මපාලතුමා යනුවෙන් පල වූයේ පමා දෙසකිනි.

- සකසු



# අනිස සොඳුරුව

පුෂ්පා ජයවර්ධන නැන්ද විසිනි.

හිරු හිනැහී ගෙන
එබී බලන විට
ලොව ම සුවඳ කර
පියුම් පිපෙයි.

සැදෑ අහස් කුස
හිරු බැස යන විට
ඒ මල් පර වී
බිමට වැටෙයි.

දැල්වූ පහන් සිළ
සුළඟේ වෙළිලා
දස දෙස විහිදා
එළිය කරයි.

ඒ සුළඟ ම යළි
පහන නිවාගෙන
අනියත දහමක්
ලොවට කියයි.

අනියත දහමේ
සැබෑ සොඳුරු බව
අප දිවි සදනා
දසුන් කෙත යි.



# කාලකණ්ණි ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.

ඒ තුන්ලෝ තිලක වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසනා සමයයි. අනේපිඬු සිටුතුමාණන්ගේ මිතුරකු වෙනුවෙන් මෙම ජාතක ධර්මය බුදුරජාණන් වහන්සේ වදාළ සේක. මෙම කථාව නොවෙනස් මිතු දමක අගය පෙන්වා දේ. මොහු අනේපිඬු සිටාණන්ගේ වැලි කෙළියෙහි පටන් මිතුරු වූ, එකට ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ, වැඩිහිටියන් බවට පත් වූ පසුවත් මිතුරු දම රැකගෙන ආ යහළුවෙකි. ඔහු නමින් කාලකණ්ණි විය. අරුතට තැබූ නමක් නොව ව්‍යවහාර වූවකි.

තරුණ වියේ දී දුගී බවට පත් වූ හෙතෙම අනේපිඬු සිටාණන් වෙත ගොස් තමාගේ දුප්පත් බව සැළ කළ පසු, සිටුතුමා ඔහු අස්වසා සැප සම්පත් මෙන් ම තම මාළිග යේ නවාතැන් ද ලබා දුනි. මිතුරු කාලකණ්ණි, අනේපිඬු සිටුතුමා සමග එක්ව ධර්මානුකූල කටයුතු මෙන් ම අනෙකුත් කාර්යයන් ඉතා හිතවත්ව ඉටු කළේ ය. මෙම මිතුරු දම නොරිස්සූ සිටුතුමාගේ අන් මිතුරකු,

"සිටුතුමනි, කුමක් නිසා මේ 'කාලකණ්ණි' හට ඔබ සලකන්නේ ද? ඔහුගේ නම ද මාළිගයට නො ගැළපේ. මොහු සිටු මාළිගයට සුදුසු නොවේ. ඒ නිසා එළවා දැමිය යුතු යි," යනුවෙන් පැවසී ය.

ඔහුගේ බසට කන් නොදුන් අනේපිඬු සිටුතුමා "කාලකණ්ණි යනු ඔහුගේ නාමය පමණයි. දුප්පත්කම නිසා ඔහු පහත් කොට නොතැකිය යුතු යැ"යි තම මිතුරාට පහදා දුනි. අනෙක් මිතුරන්ගේ අදහස් අනුමත නොකළ සිටුතුමා තම දේවිය හා සහපිරිවර සමඟ තම මිතුරු 'කාලකණ්ණි' සිටුවා මාළිගය ආරක්ෂා කිරීම බාර දී ගමනක් ගියහ. මේ බව දැනගත් සොරු රාත්‍රියේ සිටු මාළිගය වට කළහ.

විමසිල්ලෙන් පසු වූ 'කාලකණ්ණි' සොරුන් එන්නට ඉඩ ඇතැයි සිතා නොනිදා සිටියේ ය. සිතූ ලෙස ම සොරු මාළිගය වට කළහ. මේ බව දැනගත් යහළුවා මුළු මාළිගය ම නැටුම් ශාලාවක් බවට පත් කළේ ය. දැසි දස්සන් අවදි කර කෙනෙකුට සක් පිඹින්නටත්, තවෙකකුට බෙර වයන්නටත් අණ දුනි. මාළිගයේ මිනිසුන් සිටින බැව් දැනගත් හොරු ආයුධ දමා පලා ගියහ. සිටු මාළිග යට පැමිණි සිටාණෝ "අනුන්ගේ බස් අසා සුමිතුරු කාලකණ්ණි පන්නා දැමූයේ නම් අද මා හට සියලු වස්තුව අහිමි වේයැ"යි සිතූහ. නාමයට වඩා මාගේ හිත මිත්‍රයා මට අප්‍රමාණව වටනේ යැයි සිතා තවත් සංග්‍රහ කළෝ ය.

මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ "සිටුතුමනි, ඈත අතීතයේ දී පවා ඔබතුමාට මොහු යහළුවකුව සිට උදවු උපකාර කළ බැව් දැන ගන්නැ"යි පවසා අතීත කථාව වදාළහ.

පෙර බරණැස බඹදත් රජු කල, බෝසතාණෝ සියලු සැප සම්පතින් යුත් ජීවිතයක් ගත කළහ. ඔහුට කාලකණ්ණි නම් මිතුරෙක් සිටියේ ය. නොවෙනස් මිතු දමකින් බැඳුණු දෙදෙනාගේ මිතු දම බෝසතාණන් විග්‍රහ කළේ මෙසේ ය.

- දෙදෙනෙක් සත් පියවරක් ඉදිරියට එක්ව ගියහොත් මිතුරෝ වෙති.
- දොළොස් දිනක් මිතු දම පැවැත්වූවාහු නම් සහායකයෝ වෙති.
- මසක්, එකහමාරක් මිතු දම පැවැත්වූවාහු නම් ඥාතියකු හා සමාන වෙති.
- බොහෝ කලක් මිතුරු දම පැවැත්වූ කල ආත්මීය මිතු දමක් වේ.

අනේපිඬු සිටුතුමාත් මිතුරාත් ආත්මයෙන් ආත්මයට ගෙන ආ මිතු දමක් යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. සිටුතුමා සැප සම්පතින් පිරුණු දිවියක් ගෙවූ මුත් හිත මිතුරු කාලකණ්ණි සුළු කොට තැකුවේ නැත. මිතු දම අත්හැරියේත් නැත. අනේපිඬු සිටුතුමාගේ යහ ගුණ මොනවට මෙම ජාතක කථාවෙන් ගෙන හැර දැක්වේ.

අප කාලකණ්ණි ජාතකයෙන් උගත යුත්තේ කුමක් ද? තමා කොපමණ උසස් තත්ත්වයක සිටියත්, දුගී බවට පත් හිත මිතුරන් අත් නොහැරිය යුතු බවයි. ඔවුනට පිහිටවිය යුතු බවයි.

කාලකණ්ණි යහළුවාණෝ නම් ආනන්ද තෙරණුවෝ ය. බරණැස සිටුතුමාණෝ, අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය.



ළමා පෙළට මඟුල් සුතුර - 2

# පණ්ඩිතානං ච සේවනා
# නුවණැතියන් ඇසුරට යමු

සිල්වත් ගුණවත් උතුමන්
පෙන්වන යා යුතු නිසි මං
ඇසුර කැමති කැර බුහුමන්
දරුවා දැයට ම අබිමන්

යහපත් සිතිවිලි ම සිතන
යහපත් වූ බස් පවසන
යහපත් වූ වැඩ ම කරන
දරුවා බැබළෙයි නුවණින

දියුණුවෙ ඉණි මග නගින්න
දිවියෙන් අස්වනු නෙළන්න
ගුණ - නැණ - දහමින් වැඩෙන්න
පඬි දන ඇසුරෙහි රැඳෙන්න
සුපුරිස් යහ ගුණ දැරුවෝ
දැයට සිටින සඳ - හිරුවෝ
ඔවුනට අනුරූ දරුවෝ
දහමින් රට සරු කැරුවෝ

පිනැති කලණ මිතුරු ඇසුර
හැම දියුණට ඇර දෙයි දෙර
ඒ උතුමන් සෙවණ හැසිර
වනු මැන හැම දුකින් එතෙර

**– "ගුරු සීයා" විසිනි**



# ධාර්මික ගොවිතැනින් වස විස නැති ශ්‍රී ලංකාවක්

ඇළ දොල හඬා
කී දුක අසා
මහ පොළොව දෙදරා වැලපුණා
වක්කඩේ කුඩ මසුන් වඳ වී
සියලු ආහාර විසවුණා
වකුගඩු දිරා ජීවිත ගෙවා
උනුන් තැන තැන මිය ගියා
මෙවන් පින්මඳ ජාතියක් !
මිනිස් වග අද තනි වුණා
කෙළි දෙලෙන් පිරි ළමා කාලය
කුඩාවුන් අතහැර ගියා
සාපිපාසා නිවාලූ දිය
වසවිසට මුසුවී ගියා
බතින් බුලතින් පිරුණු මේ රට
වසවිසෙන් උතුරා ගියා
ජාතියක් ලෙස ලෝකයට අපි
සදාකාලික ණය වුණා.

**කුමාරදස සපුතන්ත්‍රී කවියාණන් විසිනි.**